වලිකාමම් දකුණ ප්‍රාදේශිය සභාව

යාපනය දිස්ත්‍රික්කය

-------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

--------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම.

-------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 20 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2012 මාර්තු 30 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2014 දෙසැම්බර් 19 දින සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදි.

1.2 මතය

----------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණ වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශ වලින් 2013 දෙසැම්බර් 31 දිනට වලිකාමම් දකුණ ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳව අදහස් දැක්විම.

--------------------------------------------

1.3.1 ගිණුම්කරණ ඌණතා.

--------------------------

(i.) ගිණුම් ප්‍රකාශවල නිරික්ෂණය වූ ඌනතා වත්කම්, බැරකම් සහ ආදායම් වශයෙන් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | වත්කම් | | බැරකම් | | ආදායම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | රු. | | රු. | | රු. |
| අඩුවෙන් දැක්වීම් | - | - | 02 | 25,442,497 | 01 | 158,433 |
| වැඩියෙන් දැක්වීම් | 01 | 3,242,600 | - | - | - | - |
| අත්හැරීම් | - | - | 01 | 4,284,160 | - | - |

(ii) සභාව විසින් භාවිතා කළ වාහන 09 ක වටිනාකම තක්සේරු කර ගිණුම් වලට නොගැනිම නිසා ගිණුම් වල වාහන වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම

#### විගණනය සඳහා තොරතුරු ලබා නොදීම

අවශ්‍ය තොරතුරු විගණනයට ලබා නොදීම නිසා රු.130,358,072 ක් වටිනාකමැති ගනුදෙනු 05 ක් විගණනයේදි සන්නිරික්ෂණය කළ නොහැකි විය.

### 1.3.3 අනුකූල නොවීම්

පහත සඳහන් නීති,රීති, රෙගුලාසි සහ කළමනාකාරිත්ව තීරණ වලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදි නිරික්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම් |
| --- | --- | --- |
| 1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය හා කළමනාකරණ) රීති | | |
| පරිච්ඡේදය 111 වගන්තිය 33 | - | රු.4,665,556 ක් වූ හිඟ හිටි වරිපනම් සහ බදු සම්බන්ධයෙන් වරිපනම් හා බදු ගෙවීම පැහැර හැරි පුද්ගලයින් පිළිබඳ කාර්තු වාර්තා පිළියෙල කර සභාපති වෙත ඉදිරිපත් කිරිමට බදු තක්සේරු ලිපිකරු විසින් කටයුතු කර නොතිබුණි. |
| පරිච්ඡේදය 111 වගන්තිය 76 | - | රු.2,257,559 ක් වූ හිඟ බදු කුලී පිළිබඳ ආදායම් එකතු කරන්නා විසින් ලේකම්ට දැනුම් දි නොතිබුණි. |
| වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක මුදල් | - | 2006 වර්ෂයේ අවසාන මාස 6 සඳහා වූ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා රු.222,405 ක් වූ දායක මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ප්‍රේෂණය නොකර විවිධ ණයගැති ගිණුමේ රඳවාගෙන තිබුණි. |
| මුදල් රෙගුලාසි 571 | - | 1997-2010 කාල පරිච්ඡේදයට අදාල රු.722,633 ක් වූ මිශ්‍ර තැන්පතු ශේෂ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

2. මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මුල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශ වලට අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.38,465 ක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 119,141 ක් විය.

2.2 මුල්‍ය පාලනය

අයවැය විධිමත්ව පිළියෙල කර නොතිබුණි. ඒ නිසා අයවැයගත ආදායම සහ තත්‍ය ආදායම අතර රු.12,410,589 ක වෙනසක් ද අයවැයගත වියදම සහ තත්‍ය වියදම අතර රු.15,939,641 ක් ද විගණනයේදී නිරීක්ෂණය විය.

2.3 ආදායම් කළමනාකරණය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාපති විසින් ඉදිරිපත් කරන ලද පරිදි ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම් |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 1,674 | 1,036 | 5,924 |
| (ii) බදු කුලී | 27,182 | 27,225 | 440 |
| (iii) බලපත්‍ර ගාස්තු | 3,207 | 7,395 | - |

| | | | |
|---|---|---|---|
| (iv) වෙනත් ආදායම් | 61,542 | 70,358 | 34,594 |

2.3.2 ආදායම් එකතු කිරීම

--------------------------

සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂය සඳහා රු.84,857,033 ක් වූ හිඟ වරිපනම් , බදු කුලි සහ බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සඳහා නෛතික හෝ වෙනත් ඵලදායි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.3.3 උසාවි දඩ මුදල්

--------------------

සමාලෝචිත වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය සඳහා රු.1,001,954 ක් වූ උසාවි දඩ මුදල් ලැබිය යුතු ආදායම් වශයෙන් පෙන්වා නොතිබුණි.

2.3.4 මුද්දර ගාස්තු

-----------------

(i.) 2006-2012 වර්ෂ සඳහා ආදායම් හා ලැබිය යුතු මුදල් වශයෙන් ගිණුම්ගත කළ රු.65,694,174 ක් මුද්දර ගාස්තු මෙම වාර්තාවේ දින වනතුරුත් අයකර නොතිබුණි.

(ii.) සමාලෝචිත වර්ෂය සඳහා රු.21,330,310 ක් වූ මුද්දර ගාස්තු ආදායම් හෝ ලැබිය යුතු ආදායම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

2.4 අක්‍රිය සංචිත

------------------

රු.645,771 ක් වූ ණය බරින් නිදහස් වීම සඳහා වූ සංචිත අක්‍රියව පැවතිණි.

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------------

2001-2012 වර්ෂ තුළදී දිස්ත්‍රික් ලේකම් සහ පළාත් පාලන කොමසාරිස් විසින් මරුදනම්මඩම් වෙළඳපොල සහ ජල ටැංකි සවි කිරීම සඳහා ලබාදෙන ලද රු.243,873 ක් වූ මුදල විවිධ තැන්පතු ගිණුමෙහි අක්‍රියව පැවතුණි.

2.6 වත්කම් කළමනාකරණය

------------------------------

(i.) ප්‍රධාන කාර්යාලයේ හා උප කාර්යලයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා තොග ලේඛන හා සසඳා බැලීමේදී පිළිවෙලින් අයිතම 42 ක හා අයිතම 43 ක අතිරික්ත හා ඌනතා හෙළිවිය.

(ii.) භාණ්ඩ සමීක්ෂණ වාර්තා වල දැක්වුණු පහත සඳහන් අයිතමයන් තොග පොතට ඇතුලත් කර නොතිබුණි.

| අයිතමය | සංඛ්‍යාව |
|---|---|
| ලීටර් 200 ටැංකි | 02 |
| ප්ලාස්ටික් පුටු | 26 |

2.7 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති

-------------------------------------

වටිනාකම රු.37,673,233 ක් වූ ප්‍රාග්ධන ව්‍යාපෘති 09 ක් සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක නොකර විවිධ ණයගැති ගිණුමේ ඇතුලත් කර තිබූ බැවින් ඒවායේ ප්‍රතිලාභ ජනතාවට නොලැබී තිබුණි.

3. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය අවශ්‍ය වේ.

(අ) ආදායම් රැස්කිරිම
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) ගිණුම්කරණය
(ඈ) පිරිස් පාලනය
(ඉ) පරිත්‍යාග
(ඊ) විවිධ තැන්පතු